# අපේක්ෂකයන් බරපතළ ලෙස ඡන්ද නීති උල්ලංඝනය කළා

## තෝරා ගැනීමකින් තොරව මොනරාගල සියලු දෙනාට නියං සහනාධාර දුන්නා

### - පැෆරල් සංවිධානය

ජේ. ටී. ද සිල්වා,
දූසා පෙරේරා

ආණ්ඩුවේ අනුග්‍රහය හිමිවූ බොහෝ අපේක්ෂකයන් රාජ්‍ය බලය යොදාගෙන බරපතළ ලෙස ඌව පළාත් සභා ඡන්දයේදී මැතිවරණ නීති උල්ලංඝනය කර ඇති බව පැෆරල් සංවිධානය කියයි.

මැතිවරණ ප්‍රචාරණ ක්‍රියාවලිය සඳහා රජයේ වාහන සහ සම්පත් විශාල ප්‍රමාණයෙන් අවභාවිතයට ගනු ලැබූ අතර, රාජ්‍ය සේවකයන් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා සංවිධානාත්මක ලෙස යොදවනු ලැබූ අවස්ථාද දක්නට තිබුණු බව එම සංවිධානය නිකුත් කරන ලද නිවේදනයෙහි දැක්වෙයි.

මොනරාගල දිස්ත්‍රික්කයේ නියඟයෙන් පීඩාවට පත් වූ සහ පීඩාවට පත් නොවූ සියලු දෙනාට නියං සහනාධාර ලබාදීම සිදු වූ බව එම නිවේදනයෙහි සඳහන් වෙයි.

මෙහිදී මෙම දිස්ත්‍රික්කයට සමානව හෝ ඊට වැඩියෙන් නියඟයට ගොදුරු වූ දිස්ත්‍රික්ක තිබියදී මේ



දිස්ත්‍රික්කයට පමණක් නියං සහනාධාර ලබාදීම ප්‍රශ්නාර්ථයක් බවද එම නිවේදනය මගින් පෙන්වාදී තිබේ.

මැතිවරණ ප්‍රචාරක සමයේ උද්ගත වූ අසහනකාරී වාතාවරණය මැතිවරණ දිනයේ වර්ධනය වූ බවද එමගින් පෙන්වාදී ඇත.

බදුල්ල දිස්ත්‍රික්කයේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම සඳහා පොලිසිය ක්‍රියාත්මක වුවද, මොනරාගල දිස්ත්‍රික්කයේ එය ප්‍රශස්ත මට්ටමකට ඉටු නොවූ බවද පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතාගේ අත්සනින් නිකුත් කර ඇති එම නිවේදනයෙහි වැඩිදුරටත් සඳහන් වෙයි.